හිනිදුස්ථානී සංගීතයේ දී යොදා ගන්නා බටනලාව ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය සංගීතය තුල යොදා ගැනීමේ දී සිසුන් මුහුණ දෙන්නා වූ ගැටලු

බී. ඒ. එම්. දමින්ද රංගන අතාවුද

Abstract

පැරණි ඉන්දියාවේ ඇදහීමට ලක් වූ දෙවිවරුන්ට ආවේනික වූ සංගීත භාණ්ඩ නම් කරන ලදී. උදාහරණ ලෙසින් ශිව දෙවියන්ගේ ඩමරුවත්, විෂ්ණු දෙවියන්ගේ ශංඛයත්, සරස්වතී දේවියගේ වීණාවත්, ක්‍රිෂ්ණ දෙවියන්ගේ බටනලාවත් හඳුන්වා දිය හැක. සුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් වන ශාස්ත්‍රීය බටනලාව වායු ධාරාවන් කම්පනය වීමෙන් නාදය නිපදවන්නා වූ සංගීත භාණ්ඩයකි. ශාස්ත්‍රීය බටනලාවෙහි ඓතිහාසික වැදගත්කම ශ්ලෝක මගින් ද හදුන්වා දී ඇත. හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය තුළ ශාස්ත්‍රීය බටනලාව බහුලව යොදා ගන්නා අතර, ආසියාතික මෙන්ම පැසිෆික් කලාපීය රටවල් තුළ ද ප්‍රචලිත වාද්‍ය භාණ්ඩයකි. හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය සමඟ බද්ධ වන්නා වූ සුෂිර වාද්‍ය භාණ්ඩ ඉපියා සහිත සහ ඉපියා රහිත වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැක. උදාහරණ වශයෙන් ගත් කල ඉපියා සහිත ෂෙනායි වාද්‍ය භාණ්ඩය සහ ඉපියා රහිත ශාස්ත්‍රීය බටනලාව හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය තුල සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇත. ශාස්ත්‍රීය බටනලාව මුරලි, බාන්සුරි, බන්සි, වංශි, බාෂි ආදී නම් වලින් ද හඳුන්වනු ලබයි. සුළඟේ ආධාරයෙන් නිකුත්වන බටනලාවෙහි නාදය අසන්නන්ගේ සිත් අමන්දානන්දයට පත් කරයි. ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය සංගීතය හෙවත් රාගධාරී සංගීතය තුළ බටනලාව රාග වාදනය සඳහා යොදා ගනී. ඒවා ගීත්කාරි සහ ගත්කාරි ලෙස වේ. ශාස්ත්‍රීය බටනලා වාදනයේ දී නාදය නිකුත් වන්නේ මුවින් පිටකරනු ලබන වායු ධාරාව සහ අතගිලි හැසිරීම මගිනි. වායු ධාරාවන්ගේ ප්‍රබලත්වය සහ දුබලත්වය සමගින් රාගයන්ගේ ස්වර පිහිටීම මත භාව ප්‍රකාශනය සිදු කරනු ලබයි. තව දුරටත් සඳහන් කිරීමේ දී ශිල්පියා තුළ අන්තර්ගත වූ සහජ හැකියාව, ශික්ෂණය, රාගයන් පිළිබඳව තිබෙන්නා වූ රාගාවබෝධය හා මනා පුහුණුව මත ශිල්පියාගෙන් ශිල්පියාට භාව ප්‍රකාශනය අඩු වැඩි වේ.

ශාස්ත්‍රීය බටනලාවේ තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ විවිධ හඬ පරාසයන්ගෙන් වාදනය කිරීමේ හැකියාව පැවතීමයි. එනම්, දිගින් විශාල ශාස්ත්‍රීය බටනලාවේ හඬ පහල පරාසයක පවතින අතර දිගින් කුඩා බටනලාවේ හඬ ඉහල පරාසයක පවතී. සිසුන් හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය හැදෑරීමේදී බහුතරයක් විසින් ශාස්ත්‍රීය බටනලාව වාද්‍ය භාණ්ඩයක් ලෙසින් තෝරා ගැනීමට පසුබට වීමට බලපාන්නා වූ කරුණු පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක යෙදීම මුඛ්‍ය අරමුණ වේ.

ප්‍රමුඛ පද

හිස්දුස්ථානී ශාස්ත්‍රිය සංගීතය, සුෂිර වාද්‍ය භාණ්ඩ, ශාස්ත්‍රීය බටනලාව, ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය සංගීතය, රාග

හැඳින්වීම

භාරතීය සංගීතයේ උත්පත්තිය සහ සම්බන්ධය පිළිබඳ විවිධ මත විද්වතුන් විසින් ප්‍රකාශ කොට ඇත. ඓතිහාසික සාධක මත ශාස්ත්‍රීය සංගීතයේ ආගමනය සාම වේදය සමඟ ඇති වුවාක් යයි පැරණන්ගේ පිළිගැනීමය. එකල යාඥා ආදිය මූලික කොට ගෙන සාම ගායනය සිදු කරන පරම්පරා තිබූ බවත්, කාලාන්තරයක් මුළුල්ලේ මේ සාම සංගීතය ක්‍රම ක්‍රමයෙන් විකාශනය වීමෙන් ආධුනික ශාස්ත්‍රීය සංගීතයේ ස්වරූපය බවට පරිණත වූ බව වේ. සංගීතය යන වචනයෙහි උත්පත්තිය සං + ගී + ත යන්න ය. තවත් විටෙක ස්වර, තාල හා ලය ප්‍රධාන මූලිකාංග හේතු කොට ගෙන සංගීතය ඇති වුනාක් යයි පිළිගැනීම ය. "ගීතම් වාදම් නෘත්‍යම් ත්‍රයං සංගීත් මුච්චතේ" යන්න සංගීත දර්පන් ග්‍රන්ථයේ සඳහන් කොට ඇත. ශබ්දය යනු ස්වභාව ධර්මයෙහි මූලිකාංගවලින් එකක් ලෙසත් එයින් නාදය උත්පත්තිය වන බවත් හඳුන්වා ඇත. සංගීත භාණ්ඩ වාදනය හා නර්තනය සඳහා ගායනා ප්‍රධාන වූ බවත් වේ. විටෙක මේ ත්‍රිත්වයෙහි එකතුව සංගීතය ලෙසින් සලකන ලදී. උත්තර භාරතීය සංගීතය හින්දුස්ථානී සංගීතය සහ කර්ණාටක සංගීතය ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. හින්දුස්ථානී සංගීතය

උතුරු ඉන්දියාවේ ප්‍රචලිත වී ඇති අතර මයිසූර්, මැඩ්‍රාස්, ට්‍රිචිනපොලී ආදී දකුණු ඉන්දීය කලාපයේ ප්‍රදේශ තුළ කර්ණාටක සංගීතය ප්‍රචලිත වී ඇත.

සංගීත භාණ්ඩ නිර්මාණය සහ භාවිතය අනුව වර්ගීකරණය වී ඇත. උදාහරණ ලෙසින් ගත් කල තත් වාද්‍ය භාණ්ඩ, අවනද්ධ වාද්‍ය භාණ්ඩ, සුෂිර වාද්‍ය භාණ්ඩ හා ඝන වාද්‍ය භාණ්ඩ ලෙසින් වේ. එසේ වර්ගීකරණය වූ ඉන්දියානු සංගීත භාණ්ඩ තාක්ෂණය අතින් ඉතා ඉහළ අගයකින් යුතු විය. එසේම ඒවායින් නිපදවෙන්නා වූ නාදයන් අනුව එක් එක් සංගීත භාණ්ඩයන් ව්‍යාප්තිය සිදු වූවා යැයි සිතිය හැකි ය. කෙසේ වුවත්, පරම විඥානය සහ ගුප්ත රසයන් හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය තුල ගැබ් වී ඇත.

සුෂිර වාද්‍ය භාණ්ඩ පතපොතෙහි සඳහන් වන පරිදි "මුක් වීණා" නමින් ද හඳුන්වනු ලබයි. කෘමීන් විසින් සිදුරු කරන ලද බට පඳුරු සහ වායු ධාරාවන් ගැටීමෙන් නිකුත් වන්නා වූ සිවුරුම් බෑම වැනි නාදයන් මූලික කරගෙන සුෂිර වාද්‍ය භාණ්ඩයන්ගේ උත්පත්තිය සිදු වූවා යැයි අනුමාන මතයකි. වර්තමානය වන විට සුෂිර වාද්‍ය භාණ්ඩයන් විවිධාකාරයෙන් දක්නට ලැබේ. එය ගති ලක්ෂණ හා ස්වභාවයන්ට අනන්‍ය වේ. කම්පනය අනුව පරම්පරානුගතව මෙම සුෂිර වාද්‍ය භාණ්ඩයන් වර්ගීකරණය විය. බොහෝ සුෂිර වාද්‍ය භාණ්ඩයන් නාලාකාර හැඩයකින් යුක්ත වන අතර වාදනය වන අතරතුර කම්පනය වන වායු ධාරාවන් අසුරා තබා ගැනීමට එම හැඩය උපකාරී විය. නලයේ හැඩය සහ දිග යනු නාදයේ උස්පහත් භාවය මෙන් ම, වාද්‍ය භාණ්ඩයේ ඍති ස්වරයේ පිහිටීමට ද බලපානු ලබන ප්‍රධානතම සාධකයකි. කුමන හෝ සුෂිර වාද්‍ය භාණ්ඩයක් සමඟ බැඳෙන්නා වු මූලිකාංග තුනකි. එනම්,

1. යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය (an activating mechanism)

2. භාණ්ඩය හා බැඳුණු හැඩය (The body of the instrument)

3. උණුසුම හාත්පස පැතිරවීමට යොදන උපකරණය (a radiator)[5]

භාරතයේ පැරණි සාම්ප්‍රදායික සුෂිර වාද්‍ය භාණ්ඩ පැවතිණි. දිග එමෙන්ම වාදන සිදුරු අඩු වැඩි වීම මත සුෂිර වාද්‍ය භාණ්ඩ විවිධ විය. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කැනීම් වලදී පොළවේ යටින් හමු වූ පක්ෂියකුගේ හැඩය ගත් කුඩා නලාවක් සහ හක් බෙල්ලන් විශේෂයක් පිළිබඳව පතපොතෙහි සඳහන් වේ. "වේද සංගීතය" හරහා ද භාරතයේ සුෂිර වාද්‍යයන් පිළිබඳ ව නොයෙක් සටහන් අපට හමුවේ. උදා :- වෙනු, නදී, තුනව් සහ බන්කුරා ඒ අතර වේ. 17 වන සියවස වන විට ලියවුනු වැදගත් මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙසින් "සංගීත් පරිජාත්" හඳුන්වා දිය හැකි අතර එහි සුනදි, මුරලි, පව, ශ්‍රීන්ගා, නග්සර්, කහලි, මුඛවීනා, වකී, තුන්බකිනි, චන්ගු සහ ශංඛ ආදී සුෂිර වාද්‍ය භාණ්ඩ පිළිබදව සඳහන් වේ ඇල්ගෝසා සහ සතාරා යනු ඉන්දියානු ජන සංගීතය සමඟ බැඳුණා වූ යුගල බටනලාවකි. (Double Flute) ඇල්ගෝසා පංජාබයෙහි ප්‍රසිද්ධව පවතින අතර සතාරා රාජස්ථානයෙහි ප්‍රසිද්ධව ඇත. තවද ගුජරාටයට නැකම් කියන්නා වූ බටනලාවක් ලෙස "ජොඩි - පාවො" හඳුන්වා දිය හැකි ය. ඉපියා සහිත වාද්‍ය භාණ්ඩයන්හි (Reed Instruments) "ඉපියාවට" හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. වායුමය ධාරාවන් පාලනය කරමින්, වාද්‍ය භාණ්ඩය තුලට වායුව මුදා හැරීම ඉපියාවෙන් සිදුවේ. ඉපියාවක් සහිත වාද්‍ය භාණ්ඩ ලෙස පුංගි (නයිනලාව), තුම්බි, නගසර්, මහුඩි" යන භාණ්ඩ හැඳින්විය හැකි ය. "ෂෙනායි, නාගස්වරම් සහ සුන්දරී" යන වාද්‍ය භාණ්ඩයන් ඉපියාවන් යුගලයක් සහිත වාද්‍ය භාණ්ඩ සඳහා නිදසුන් වන අතර අද වන විට "හාර්මෝනියම්" වාද්‍ය භාණ්ඩ නිදහස් ඉපියාවන් රහිත වුත් වාද්‍ය භාණ්ඩයක් ලෙස නම් කර ඇත. (Free reeds Instruments)

භාරතයේ පුරාවෘත්තයන්ට අනුව ක්‍රිෂ්ණා දෙවිදුන් හා දැඩිව බැඳුණු බටනලාව සදා අමරණීයත්වයට පත්විය. ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලට අයත් ගුහා සහ පූජනීය ස්ථානයන්හි අඳින ලද චිත්‍ර සහ නෙලන ලද මූර්ති වැනි වූ බොහෝ සාධක හේතු කොට ගෙන පුරාණයේ සිට බටනලාව ව්‍යාප්තව ඇති බව තහවුරු වී ඇත. එම චිත්‍ර හා මූර්ති මගින් බටනලාව වාදන ඉරියව් නිරූපණය විය. උදාහරණයක් ලෙස 2 වන ශතවර්ෂයට අයත් වන අජන්තා ලෙන්වල බටනලාව වාදනය කරනු ලබන කාන්තාවන් දෙදෙනකුගේ චිත්‍ර නිරූපණය වේ. අක්බාර් රජ සමයේ විසූ ක්‍රිෂ්ණා දෙවිදුන් ඇදහූ කවීන් අට දෙනෙකු පිළිබඳවත්, ඔවුන්ගේ කවිවල බටනලාව සහ ක්‍රිෂ්ණා දෙවියන් අතර පවත්නා සහ සම්බන්ධය පිළිබඳවත් විස්තර කර ඇත. තවත් සංකල්පයකට අනුව, මේ ආදිය වන විට බටනලාව අත දැරූ උසස් ප්‍රතිමා මගින් හින්දුස්ථානි ශාස්ත්‍රීය සංගීතය මූලික කරගත් ශාස්ත්‍රීය සංගීත භාණ්ඩයක් ලෙසින් බටනලාව ක්‍රම ක්‍රමයෙන් ජනතාව අතර ප්‍රචලිත විය.

"වේනු හී මාරුතෝ තෝද දුතේ හ

කුජමිත මේච් කීචකේහඃ

නීහ ස්වශාන්ත මීවා පර්ෂාද්

ගෝ්රැ යෂී විෂත්ව මේහ ” (**Kasliwal , 2001**)

“පර්වතයක් තරම් විශාල වූ උණ පදුරකට වායුව වැදුණු කල උණ පදුර සෙලවීම නිසා එයින් නිකුත්වන ධ්වනිය බටනලාවෙන් නිකුත්වන ධ්වනියට සමානය. තවත් විටෙක මෙය විෂඝෝර සර්පයකු හුස්ම ගෙන පිට කිරීමේ දී ඇතිවන ශබ්දය බටනලාවෙහි නාදයට සමාන ය” යන්න වාල්මිකී විසින් රචිත ශ්ලෝකයක වේ. බටනලාව ක්‍රිෂ්ණා දෙවියන්ගේ පරම ප්‍රිය, ආත්මය කොට ගත් වාද්‍ය භාණ්ඩය වූ හෙයින් එහි ඇති මාධුර්යද වස්තු බීජ කොට ගෙන භාරතීය ජන සමාජය තුළ මුල් බැස ගන්නා ලදී. එමෙන්ම බටනලාව ක්‍රිෂ්ණා සහ රාධාගේ ආදර වෘතාන්තය සමග එක එල්ලේ බැදෙන අතරමම ඔවුන් දෙදෙනාගේ "රාස් ලීලා" නර්තනය සඳහා ද යොදා ගනී. බටනලා සෑදීමට වඩාත් උචිත බට ලී ලබා ගැනීම සඳහා ඉන්දියාවේ ඇසෑම් සහ ත්‍රිපුරා යන ප්‍රදේශ ප්‍රසිද්ධත්වයක් උසුලයි. සාමාන්‍යයෙන් බටනලාවක දිග අඩි $2^{1}/_{2}$ ක් 3 ත් වන අතර උණ ලීයේ ඝනත්වය මත එය රඳා පවතී. උතුරු ඉන්දියානු බටනලාවක සාමාන්‍ය සිදුරු 06 ක් සහ පිඹින සිදුරක් අන්තර් ගත වේ. එහෙත් ඇතැම් නිර්මාණකරුවන් විසින් සිදුරු අටකින් යුත් බටනලාවක් ද නිර්මාණය කර ඇත. පන්නලාල් හෝෂ් නොහොත් පන්න බාබු විසින් අතිරේක සිදුරක් මන්ද්‍ර සප්තකයේ තීව්‍ර මධ්‍යමය උපදවා ගැනීම සඳහා නිර්මාණය කර ඇත. අතැඟිලි ඇඟිලි ඍජුවම බටනලාවේ සිදුරු මත තබා වාදකයාගේ මෙහෙය වීමෙන් රාගයන්හි මෘදු මොලොක් බව මෙන්ම දැඩි බවද ඇති කිරිමට සමත් වන අතර එයින් විවිධ රාග භාවයන් උද්දීපනය කිරීමට සමත්වේ. ශාස්ත්‍රීය බටනලාව වාදනය කිරීමේ නිවැරදි ඉරියව්ව වන්නේ වාදකයා පොළොව මත පද්මාසනාරූඪව අසුන් ගෙන කද සහ සිරස කෙලින් තබාගෙන වාදනය කිරිම ය. මෙසේ වාදනය කිරීම වාදකයාගේ පෙනහලු මුළුමනින්ම වායුවෙන් පිරී යෑමටත් එයින් හොඳින් හුස්ම ගැනීමට, හොදින් පිඹීමට සහ දීර්ඝ වේලාවක් පුහුණුවීම් කටයුතු සිදු කිරීමටත් උපකාරී වේ

හොඳ නාදයක් ලබා ගැනීම සඳහා බටනලා වාදකයකුට තමාගේම වූ හැඩයකට අනුගත වී වාදනය කිරීමෙන් හොඳ නාදයක් උත්පාදනය කර ගැනීමට හැකියාව ලැබේ. හුස්ම පාලනය කිරීමෙන් විවිධාකාර වූ නාදයන් හි උස් පහත් භාවයන් ළඟා කර ගත හැකි ය. දිව සහ උගුරේ ආධාරයෙන් ස්වර නිෂ්පාදනය කිරීම මෙම වාද්‍ය භාණ්ඩයෙහි සුවිශේෂ ලක්ෂණය වන්නේ ය. රාගධාරී ශාස්ත්‍රීය බටනලා වාදනයක දී පිළිගත් බටනලාව වනුයේ පහළ (Bass) සහ භාවාත්මක නාදයක් ජනිත කරවන්නා වූ බටනලාවයි. එම හැඩතළය රසිකයාගේ අධ්‍යාත්මය විවර කිරීමට ඉවහල් වනවා සේම මනස ආනන්දයෙන් ආනන්දයට පත් කරයි. පිළිගත් ඍති ස්වරය වනුයේ මධ්‍යය ගාන්ධාරයයි. ඉහළ හැඩතළයකින් යුත් ප්‍රමාණයෙන් කුඩා බටනලාව අර්ධ ශාස්ත්‍රීය ගායනා ශෛලීන් සහ සම්බන්ධ වේ. උදාහරණ වශයෙන් ධූන්, බට්යාලී සහ චෙති යන ශෛලීන් පෙන්වා දිය හැකි ය. උත්තර ප්‍රදේශයේ "පිලි බිට්" නම් වූ නගරය බටනලා සෑදීමේ සහ ව්‍යාප්තිය සිදුකරන ප්‍රධානතම නගරයක් ලෙස හැඳින්විය හැකි ය. ශිල්පියාගේ අභිමතය පරිදි ඔහුගේ බටනලාව නිර්මාණය කිරීම සඳහා බටනලා නිර්මාපකයාගෙන් ලැබෙනුයේ ඉහළ දායකත්වයකි. පන්නලාල් ගෝෂ් (1911 - 1959) බටනලාව පුනර්ජීවනයක් ලබා දුන් පුරෝගාමියා වූ අතර ආලාප, ජෝඩ්, ජලා, තාන් සහ ගත් වැනි මුලිකාංග සමග පරිපුර්ණ ශාස්ත්‍රීය බටනලා වාදනයක් ඉදිරිපත් කිරීමේහි ලා ප්‍රථමයා ද වන්නේය. එමෙන්ම එතුමාගේ ශෛලිය ධෘපද් සහ ගායකී අංගයන් සමග මනාව පෑහීමත් එයට සමගාමීව ධුම්රි, කජරි වැනි ජන ගායනාවන් වාදනය කිරීමත් එතුමා ලද සුවිශේෂී හැකියාවකි. දේවේන්ද්‍ර මුර්දේශ්වර්, විජය රාගව රාඕ, පන්නා බාබු මගගත් ශිෂ්‍යයන් වේ. ශාස්ත්‍රීය බටනලාව ජාත්‍යන්තරයට ගෙන යාමට දායක වූ විද්වත් වාද්‍ය ශිල්පියා ලෙසින් පණ්ඩිත් හරි ප්‍රසාද් චෞරසියා හඳුන්වා දිය හැකි ය. වායු ධාරාවන්ගේ මනා පාලනයක්, විස්මිත ඇඟිලි හැසිරවීමක් නිසා පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා ඉන්දියාව මෙන්ම විදේශීය රසිකයන් අතර ද ඉමහත් ප්‍රසිද්ධියත්වයට පාත්‍ර විය. දෙඅතෙහි සම්බන්ධතාවය සමගම වායු ධාරාවන් බටනලාව තුළට මනා පාලනයකින් යුතුව අනුගත කිරීමේ සුවිශේෂී හැකියාවන් ඔහු සතුය. ගායකී මෙන්ම තන්ත්‍රකාරී අංග වලින් පරිපූර්ණ වූ ඔහුගේ වාදනයන් රසිකයින් අමන්දානන්දයට පත් කරවයි. ආලාප සහ ජෝඩ් වාදනය පිළිබඳ මනා විශාරදයකු වූ හරිප්‍රසාද් චෞරසියා බටනලාවෙහි නව මං පෙත් විවර කළ ශ්‍රේෂ්ඨ ශිල්පියකු ලෙස ඉතිහාසයට එකතු වී ඇත. ප්‍රසිද්ධ තුරුණු බටනලා වාද්‍ය ශිල්පීන් අතර රොනු මජුම්දාර්, රාජේන්ද්‍ර ප්‍රසන්න, හර්ෂ වර්ධන්, රූපක් කුල්කරනි, සුනිල් කෙන්ට් ගුප්තා, ආනන්ද මුර්දේෂ්වර් ප්‍රධාන ස්ථානයක් හිමි කරගෙන ඇත.

පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය සංගීතයේ වාදනය වන බටනලාව, යම් යම් කාරණාවන් නිසා ව්‍යාප්තියෙහි අඩුවක් දක්නට ලැබේ. නිවැරදි ඍති ගත වූ ශාස්ත්‍රීය බටනලාවක් නිර්මාණය කිරීම සහ සොයා ගැනීම තරමක් දුෂ්කර කාරණාවකි. දිග බට ලී සොයා ගැනීමේ අපහසුවක්, බටනලා නිර්මාපකයන් සුළු වශයෙන් ව්‍යාප්ත වීමත් ව්‍යාප්තිය අඩුවීම කෙරෙහි බලපාන සාධකයකි. කෙසේ වුවත්, වර්තමානය වන විට බටනලා සැකසීමේ කලාව සහ ඒ පිළිබඳ උනන්දුවන්නා වූ පිරිසක් බිහිවෙමින් පැවතීම සතුටට

කාරණාවකි. සුදුසු බටලී විශේෂ ලංකාවේ රෝපණය කිරීමට පවා ලාංකික බටනලා නිර්මාණකරුවන් මේ වන විට පෙළඹී ඇත.

හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතයෙහි එන ඇතැම් රාග සහ ශාස්ත්‍රීය බටනලාවෙහි දායකත්වය අතර සබැඳියාව පිළිබඳව විචක්ෂණශීලී විමසීමක් මෙහිදී සිදු කෙරේ. රාග රාගිනි පද්ධතිය පදනම් කරගත් රාග වාදනයේ දී බටනලාව සඳහා වඩාත් උචිත සහ තරමක් උචිත රාග ඇතැයි යන්න මගේ ප්‍රායෝගික අත්දැකීමයි මෙහිදී තරමක් උචිත යැයි මා අදහස් කරනු ලබන්නේ, ඇතැම් රාග භාවයන් උද්දීපනය කිරීමට බටනලාව සමත් වුව ද එය ප්‍රමාණවත් පරිදි සිදු නො වීමයි. උදාහරණ ලෙසින් කල්‍යාණ රාගයෙහි ප රි යන මුඛ්‍යය ස්වර ඛණ්ඩය මීන්ඩ් සහිතව ඉදිරිපත් කිරීමට බටනලාව අපොහොසත් වෙයි. (ප සිට රි දක්වා මීන්ඩ් කිරීමට ස්වභාවයෙන් ම නොහැකිය.) පූරියා වැනි මන්ද්‍ර සප්තකය ඇසුරු කරන රාග වාදනයේ දී 'ම'ධනිධසනිරිස" යන භාවාත්මක ස්වරාවලි නිරූපණයට ද බටනලාව අපොහොසත් සහ සීමා සහිත වේ. ඖඩව ජාතීන්ට අයත් රාග වාදනය කිරීමෙහිලා බටනලාවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. තානාලංකාර වාදනයට මෙන්ම ඒවායේ වේගය තියුණු කිරීමට බටනලාවේ ඇති පහසුව එයට හේතු සාධක වේ. උදාහරණ ලෙස හිම්පලාශ්‍රී, හින්න සඩ්ජ්, මුල්තානි වැනි රාග නම් කල හැකි ය. රි, ග, ම', ධ, නි යන ස්වරයන් එකවර හෝ ඒවායින් ස්වර දෙක තුනක් පමණක් යෙදෙන රාග බටනලාවෙන් වාදනය කිරීමේ දි තරමක් අපහසු වේ. එය එසේ වුවද, ශිල්පියාගේ පරිණතභාවය, මනා පුහුණුව සහ රාගයන් පිළිබඳ වූ බහුශ්‍රැතභාවය අනුව එම අභියෝගයන් ජය ගනිමින් භාවාත්මක වාදනයක් ඉදිරිපත් කිරීමට ද්වාරය විවර කර ගත හැකි වේ.

වාදනය පුරාවට අඩුම ලෙස පැයක කාලයක් වත් වායු ධාරාවන් නිකුත් කිරීමට වීම සහ සැලකිය යුතු තරම් දුර ප්‍රමාණයන් අතර සිදුරු මත ඇඟිලි විසුරුවා හැරීම හේතු කොටගෙන ශිල්පියා වෙහෙසට පත්වීම ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය සංගීතය තුළ බටනලාවේ දායකත්වය කෙරෙහි බලපවත්නා වූ තවත් ඍණාත්මක සාධකයකි. හිසෙහි වේදනාව ඇති වීම, ඇඟිලිවල වේදනාවන් ඇතිවීම ආදී දුෂ්කරතා විශේෂයෙන් ම දිගු බටනලා වාදනයේ දී ඇති වේ. කාන්තාව බටනලාවෙන් තරමක් දුරස් වීමට මෙය බලපාන බව පෙනේ. මනා පුහුණුවෙන්ම මෙම තත්ත්වයන් මගහරවා ගත හැකි අතර බටනලාව වැයීමට ඉතා කැමැත්තක් ඇති ශිෂ්‍යයින් මෙම බාධක ජයගෙන ඉදිරියට යනු ඇත. නිවැරදි ඝෘති ගතවන බටනලාවක් නිර්මාණය වුව ද ශිල්පියාට නිවැරදි ඝෘති උපදවා ගැනීමට නො හැකි වීම බටනලා වාදනයේ දී ශිල්පියා මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. සමස්ත ඉදිරිපත් කිරීම ඝෘති වලින් තොර වීම නිසා රසිකයා අපහසුතාවයට පත්වීම මෙන්ම ශිල්පියා ද අපහසුතාවයට පත්වීම ගැටලු සහගත තත්ත්වයකි. ශ්‍රවණය ඉතාමත් තියුණුවීම හෙවත් කර්ණේන්ද්‍රියන් පිහිටීමත් තොල් හැසිරවීමේ සහ වායු ඇතුළත් කිරීමේ මනා සමබරතාවයක් තිබීමත් ශිල්පියා මෙම ගැටලුවෙන් මුදා ගැනීමට මහෝපකාරී සාධකයක් වේ. වයලීනය, ගිටාරය වැනි සංගීත භාණ්ඩ ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත වීම හේතුකොට ගෙන බටනලාවේ ව්‍යාප්තිය ඒවාට සාපේක්ෂව අඩුවක් පෙන්නුම් කරන අතර ආචාර්යවරුන්ගේ නිවැරදි මග පෙන්වීමෙන් සහ විද්‍යාර්ථයන් තුළ බටනලාව වාදනය පිළිබඳ ධන ආකල්පයන් වර්ධනය කිරීමෙන් මෙම තත්ත්වයන් මග හරවා ගත හැකි බව පෙනී යයි

පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයක් සිදු කිරීමේ දී යම් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර එම ක්‍රමවේදය පර්යේෂණයෙහි සාර්ථකත්වයට ප්‍රබල දායකත්වයක් ලබා දිය යුතුවේ. මෙම ක්‍රමවේදය තුළින් ගැටලු පිළිබඳ පූර්ණ විග්‍රහයක් කිරීමට අවශ්‍ය ඉඩ අවකාශ සැලසේ. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ උත්තර භාරතීය සංගීත අධ්‍යනාංශය තුළ බටනලාව විෂයක් ලෙසට තෝරා නොගත් විද්‍යාර්ථයින් 25 දෙනෙකු ආශ්‍රයෙන් සිදු කෙරෙන මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ ක්‍රමවේදය වන්නේ ප්‍රශ්නාවලි ක්‍රමවේදයයි. ඒ අනුව සමීක්ෂණයට භාජනය වන විද්‍යාර්ථයින්ට ලබාදුන් ප්‍රශ්නාවලිය පහත පරිදි වේ.

1. විද්‍යාර්ථයාගේ සම්පූර්ණ නම : - ....
2. ඉගෙනුම ලබන වසර : - ....
3. හදාරනු ලබන ප්‍රධාන විෂය : - ....
4. හදාරනු ලබන අනු විෂය : - ....
5. ශාස්ත්‍රීය බටනලා වාදනයන් ඇසීමට ඇති කැමැත්ත / ඇකමැත්ත : - …………..……
6. පාසල් සමය තුළ බටනලාව පිළිබඳ උනන්දුවක් දැක්වූවාද යන්න : - …………………

7. වාද්‍ය භාණ්ඩයක් ලෙසින් බටනලාව ඉගෙනීමට ඇති කැමැත්ත / අකමැත්ත : -..................

8. එසේ වීමට හේතුව : - ....

9. දිනය : - ....

10. අත්සන : - ....

ඒ අනුව හින්දුස්ථානී ශාස්ත්‍රිය සංගීතයේ සුෂිර වාද්‍ය භාණ්ඩයක් වන ශාස්ත්‍රීය බටනලාව ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රිය සංගීතයේ රාග වාදනයේ දී විද්‍යාර්ථයින් මුහුණ දෙන්නා වූ ගැටලු හඳුනාගෙන සහ එම ගැටලු සඳහා විසඳුම් යෝජනාවලියක් මෙහිදී ඉදිරිපත් කෙරේ.

දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව

උක්ත සමීක්ෂණයට අනුව ශාස්ත්‍රීය බටනලාව වාදනයෙන් කටහඬට විය හැකි බලපෑමත්, වාදනය කිරීමට ඇති අපහසුවත් යන ගැටලු තත්වයන් විද්‍යාර්ථීන් විසින් සමීක්ෂණයේදී සඳහන් කරන ලදී. එසේ වුවද බහුතර පිරිසකගේ අදහස වනුයේ, ශාස්ත්‍රීය බටනලාවෙහි නාදය ඇසීමට ප්‍රිය ජනක වුවත් වැයීමට ඇති අපහසුව නිසා ශාස්ත්‍රීය බටනලාව තෝරා නොගන්නා බවයි. මෙම ගැටලුකාරී තත්වයන් පිළිබඳව අධ්‍යයනය සඳහා සංගීත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමග සම්මුඛ සාකච්ඡා කර ලබා ගත් තොරතුරු පහත දැක්වේ.

1. ප්‍රවීණ බටනලා වාද්‍ය ශිල්පී වී.හේමපාල මහතාගේ අදහස වුයේ යමෙකු කුඩා කල සිටම ශාස්ත්‍රීය බටනලාවේ පමණක් හරඹ දක්වන්නේද, එය ඔහුගේ කටහඬෙහි පහළ පරාසයෙහි ස්වර ගායනාවන් ක්‍රමයෙන් හීන වී යාමට බලපාන්නා වූ හේතු සාධකයක් බව ය. ශාස්ත්‍රීය බටනලා වාදනයට යොමු වූයේ තුරුණු වියේදී නම්, එම මතය වෙනස් වන අතර, ගායනය සහ වාදනය සම පුහුණුවෙන් මෙම ගැටලුකාරී තත්වය මඟහරවා ගත හැකි බවත් එතුමා තවදුරටත් පෙන්වා දෙන ලදී.

2. ප්‍රවීණ බටනලා වාද්‍ය ශිල්පී ප්‍රියන්ත දසනායකයන්ගේ මතය වන්නේ, ශාස්ත්‍රීය බටනලා වාදනය කටහඬ කෙරෙහි බලපෑමක් නො දක්වන බවය. දකුණු ඉන්දීය ගායන ශිල්පී අරුණ් මෝසි මහතා දක්ෂ බටනලා වාද්‍ය ශිල්පියෙකු වන බවත්, එය ඔහුගේ කටහඬට බාධාවක් වී නොමැති බවත් දසනායකයන්ගේ අදහසයි.

3. ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලයේ විදුහල්පති වන අමිත බණ්ඩාර මහතා ද ප්‍රවීණ බටනලා වාද්‍ය ශිල්පියෙකු වන අතර, දක්ෂ ගායන ශිල්පියකු ද වේ. ඒ මහතාගේ අදහස වන්නේ ශාස්ත්‍රීය බටනලා වාදනය ගායනය කෙරෙහි බලපෑමක් සිදු නොකරන බවය. බටනලා වාදනයෙන් පසු ගායනය කිරීමට අපහසු බව පිළිගන්නා අතර, එය එසේ සිදු වනුයේ උගුර වෙහෙසට පත්වීම නිසා බවත්, එය දිගටම බලපවත්නා තත්වයක් නොවන අතර දක්ෂ වාදකයින්ම දක්ෂ ගායකයින් බවට පත් වී සිටින බවත් ඔවුන් ක්ෂේත්‍රයේ සුවිශේෂී වන බවත් තවදුරටත් අදහස් දක්වන ලදී.

4. ෆෝචූන් සංගීත කණ්ඩායමේ සැක්සෆෝන් වාදන ශිල්පී ජයන්ත දිසානායක මහතා පවසා සිටියේ බටනලාව හා කටහඬ අතර සම්බන්ධයක් නොමැති බවත්, එම මතය කෙනෙකු මනසින් සාදාගන්නා දෙයක් පමණක් වන බවය. අධික ලෙස කෑගසමින් ගායනා ඉදිරිපත් කිරීමෙන් කටහඬ වෙනස් වීමට ඉවහල් වන බව තවදුරටත් පැවසීය.

5. තුරුණු ගායන ශිලිපියෙකු වන තීක්ෂණ අනුරාධ මහතා ද දක්ෂ බටනලා වාදකයකු ද වේ. ඔහු පවසා සිටියේ ශාස්ත්‍රීය බටනලා වාදනයෙන් තම ගායන හැකියාව පන්නරයක් ලැබූ බවයි. ඍති පවත්වා ගැනීම, අපහසු ස්වර ඛණ්ඩයන් ගායනය කිරීමේ හැකියාව, හුස්ම රඳවා ගැනීම වැනි කාරණා වලදී බටනලා වාදන හැකියාව ඉවහල් වූ බව එම මහතාගේ මතය විය.

නිගමන හා යෝජනා

ශාස්ත්‍රීය බටනලාවක් නිර්මාණය කිරීමෙහිලා අවශ්‍ය දිගින් යුතු බටලී සොයා ගැනීමේ අපහසුතාවය, ශ්‍රී ලංකාවේ බටනලා නිර්මාණකරුවන් සුළුතරයක් වීම, සමහර රාග වාදනයේදී රාග භාවයන් උද්දීපනය කිරීමෙහිලා ශාස්ත්‍රීය බටනලාව අපොහොසත් වීම, ශාස්ත්‍රීය වාදනය පුරාවට වායු ධාරාවන් නිකුත් කිරීමට සහ සැලකිය යුතු දුර ප්‍රමාණයන් අතර සිදුරු මත අඟිලි විසුරුවා හැරීම හේතුකොට ගෙන ශිල්පියා හෝ ශිල්පිනිය වෙහෙසට පත් වීම වැනි කරුණු කාරණා ගැටලු ප්‍රකාශයේදී ගෙන හැර දැක්වූවද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය තුළ බටනලා

විෂයක් ලෙස තෝරා නොගත් විද්‍යාර්ථයින් විසිපස්දෙනකු ආශ්‍රයෙන් සිදු කළ ප්‍රශ්නාවලි ක්‍රමවේදගත් සමීක්ෂණයට අනුව අනාවරණය වූ ඔවුන්ගේ ගැටලු පහත අයුරින් දැක්විය හැකි වේ.

1. .ශාස්ත්‍රීය බටනලා වාදනයෙන් කටහඬට බලපෑමක් වේ යැයි යන මතය නිසා බටනලාව තෝරා නොගැනීම.

2. නාදය අසීමට ප්‍රියජනය වුවද වැයීමට ඇති අපහසුව නිසා බටනලාව තෝරා නොගැනීම.

උක්ත කරුණු නිරීක්ෂණය කිරීමේදී ශාස්ත්‍රීය බටනලා වාදනය සහ ගායනය සමසේ සිදු කරන්නේද එය එකිනෙකට බාධාවක් නොවන බව පෙන්වා දිය හැකි වේ. ගායනයත්, ශාස්ත්‍රීය බටනලා වාදනයත් සමසේ පුහුණු වීමෙන් මෙම ගැටලු දුරු වේ. පුරාතන ජන සමාජයේ ඉතා ප්‍රචලිත ජන සංගීත භාණ්ඩයක් වූ බටනලාව ගුරු ඇසුරකින් තොරව ස්වයංව පුහුණු වී වාදනය කරන ලද්දකි. එබැවින් එය ඉතා අසීරු සංගීත භාණ්ඩයක් ලෙස දක්වන අදහස සාවද්‍යය ය. මෙහිදී ශාස්ත්‍රීය බටනලා වාදකයකුට තමාගේ කැපවීම, ඊට ඇති රුචිකත්වය, ශික්ෂණය, නිවැරදි අභ්‍යාසය හා ප්‍රවීණයන්ගේ මඟ පෙන්වීම පවතී නම් දක්ෂ ශාස්ත්‍රීය බටනලා වාද්‍ය ශිල්පියෙකු වීම පහසුවෙන් ජය ගත හැකි අභියෝගයකි.

ඒ අනුව මෙරට හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය හදාරන සිසුන් බටනලාව භාවිත කිරීමේදී මුහුණ දෙන ගැටලු නිරාකරණය කිරීමටත් බටනලාව ඔවුන් අතර ප්‍රවර්ධනය කිරීමටත් පහත නිර්දේශය සහ යෝජනා ඉදිරිපත් කළ හැකිය.

1. වර්තමානය වන විට ලංකාවේ බටනලා නිර්මාණකරුවන්ගේ සංඛ්‍යාව ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින අතර ඔවුන් බටනලාව සෑදීමට වඩාත් සුදුසු උණ ගස් රෝපණය කිරීමට පවා පෙළඹී සිටීම ඉතා සතුටට කරුණකි. එමගින් ශාස්ත්‍රීය බටනලා වාදනයෙහි ප්‍රවර්ධනයට ඉමහත් සේවයක් වන අතරම නිවැරදි බටනලාවත් තෝරා ගැනීමට ඇති අපහසුව දුරුවනු ඇත.

2. වාදනය සඳහා රාග තෝරා ගැනීමේදී ඒ ඒ වාද්‍ය භාණ්ඩයන් සඳහා සුදුසු රාග පවතින අතර එම රාග වාදනයේදී ශිලිපියාගේ නිපුණත්වය මත උපරිම වින්දනයක් රසිකයාට ලබා දීමට හැකි වීමෙන් සමහර රාග භාවයන් උද්දීපනය කිරීමේ අපහසුව හේතුකොට ගෙන බටනලාව අතහැරීමට සිසුන් පෙළඹීම වළකාලීම වඩාත් ධනාත්මක දෘෂ්ටියකින් බටනලාව කෙරෙහි සිසුන් යොමු කිරීමත් අවශ්‍ය වේ.

3. මනා පුහුණුවීම, කැපවීම තුලින් බටනලා වාදනය අතරතුර සිදුවන අපහසුතාවයන් (අගිලි හැසිරවීම, වායු ධාරාවන් සැලකිය යුතු කාලයක් තුළ මුදාහැරීම) මග හැරී යන බව පෙනේ. දක්ෂ ගුරුවරයකු යටතේ ආශාවෙන් සහ විෂයට ආදරය ඇතුව පුහුණුවීම් කොට ශාස්ත්‍රීය බටනලාවේ උන්නතියට දායක වන ලෙස මම යෝජනා කරමි.

ග්‍රන්ථ නාමාවලිය

Sharma, S. 1996. *Fundamentals of Indian Music.* New Delhi: Prathibba Prakashan.

Kasliwal, S. 2001. *Classical music Instrument*. New Delhi: Rupa & Co.

සම්මුඛ සාකච්ඡා

වී.හේමපාල මහතා - 2019.11.14 සහ 2019.11.15 බටනලා වාදනයෙන් කටහඬට ඇති වන බලපෑම පිළිබඳව - දුරකථන මාර්ගයෙන්.

ප්‍රියන්ත දසනායක මහතා - 2019.11.15 බටනලා වාදනයෙන් කටහඬට ඇති වන බලපෑම පිළිබඳව - දුරකථන මාර්ගයෙන්.

අමිත බණ්ඩාර මහතා - 2019.11.16 බටනලා වාදනයෙන් කටහඬට ඇති වන බලපෑම පිළිබඳව - දුරකථන මාර්ගයෙන්.

ජයන්ත දිසානායක මහතා - 2019.11.16 බටනලා වාදනයෙන් කටහඬට ඇති වන බලපෑම පිළිබඳව - දුරකථන මාර්ගයෙන්.

තීක්ෂණ අනුරාධ මහතා - 2019.11.16 බටනලා වාදනයෙන් කටහඬට ඇති වන බලපෑම පිළිබඳව - දුරකථන මාර්ගයෙන්.

සිසුන් 25 දෙනා සමග කළ සාකච්චාව 2019.11.12 වන දින - බහුතරයක් සිසුන් බටනලාව තෝරා නොගැනීමට පසුබටවන්නා වූ කරුණු කාරණා පිළබඳව විමසීම - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේදී.